ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධි පාඨමාලාව

අදියර 3
**AFU3572 - සූක්ෂම ආර්ථික විද්‍යාව**
අවසාන පරීක්ෂණය - 2025/2026
කාලය - පැය තුනයි (03)

*දිනය: 2026 ජුනි 28* *වේලාව: පෙ.ව. 9.30 - ප.ව. 12.30*

*උපදෙස්:*

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත වේ.
- ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු හිමිවේ.
- කරුණාකර ඔබේ විභාග අංකය (Index Number) පිළිතුරු පත්‍රයේ ලබා දී ඇති ඉඩෙහි දක්වන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය මුද්‍රිත පිටු තුනකින් (03) සමන්විත වේ.
- පිළිතුරු පත්‍රය ඔබේ පිළිතුරු පොත් පිංචට අමුණන්න.
- වැඩසටහන් සම්පදනය කළ නොහැකි (non-programable) ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඇත.

**<u>ප්‍රශ්න අංක 01</u>**

**අ)** **i.** "ඉල්ලුම් නියමය" (Law of Demand) සහ "සැපයුම් නියමය" (Law of Supply) අතර වෙනස රූප සටහන් (Illustrations) ඇසුරින් හඳුනාගන්න.

**ii.** සෑම භාණ්ඩයකම ඉල්ලුම, ඉල්ලුම් නියමය අනුකූල කරන්නේද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

**(ලකුණු 05 x 2= ලකුණු 10)**

**ආ)** පහත සඳහන් වෙනස්වීම් දී ඇති භාණ්ඩයේ වෙළඳපොළ කෙරෙහි ඇති කරන බලපෑම රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

**i.** විද්‍යුත් වාහන (EV) නිෂ්පාදන කර්මාන්තය තුළ කැපී පෙනෙන තාක්ෂණික දියුණුවක් සිදුවී ඇත. විද්‍යුත් වාහන (EVs) වෙළඳපොළ.

**ii.** ඉන්ධන මිල ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර, විද්‍යුත් (Electric) වාහන වෙළඳපොළ.

**iii.** මිනිසුන් මස් අනුභව කිරීමේ අහිතකර සෞඛ්‍ය බලපෑම් පිළිබඳව වැඩි වැඩියෙන් දැනුවත් වී ඇත, මස් නිෂ්පාදන වෙළඳපොළ.

**iv.** අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ධීවරයින්ට තම රැකියාවෙහි නිරත වීමට නොහැකි වී ඇත, මාළු වෙළඳපොළ.

*ඉඟිය: දී ඇති වෙනස්කම් අනුව ඉල්ලුම් හෝ සැපයුම් වක්‍රය විතැන් වන දිශාව හඳුනා ගන්න. එය වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණයට බලපාන ආකාරය රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.*

**(ලකුණු 2.5 x 4 = ලකුණු 10)**

## ප්‍රශ්න අංක 02

**අ) i.** අ) භාණ්ඩයේ ස්වභාවය සහ, ආ) ආදේශක භාණ්ඩවල සුලභ බව (Availability of substitutes), නිශ්චිත භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවයේ (Price Elasticity of Demand) ස්වභාවය තීරණය කරන්නේ කෙසේද? උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 06)**

**ii.** ආයතනයක කළමනාකරුවෙකු එම ආයතනය මඟින් වෙළඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩ කිහිපයක මිල ගණන් වෙනස් කිරීම මඟින් ආයතනයේ උපයන ආදායම වැඩි කර ගැනීමට බලාපොරොත්තු වේ නම්, නිවැරදි තීරණවලට එළඹීම සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ දැනුම ඔහුට උපකාරී වන්නේ කෙසේද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 06)**

**ආ)** නම්‍යතා සංකල්පය පිළිබඳ දැනුම උපයෝගී කර ගනිමින්, පහත සඳහන් ප්‍රකාශයන් සමඟ ඔබ "එකඟ වන්නේද" යන්න පැහැදිලි කරන්න.

**i.** සෙවන් අප් (7up) සහ ස්ප්‍රයිට් (Sprite) අතර පවතින හරස් ඉල්ලුම් මිල නම්‍යතාවයේ (Cross Price Elasticity) අගය ඉතා ඉහළ විය යුතුය.

**ii.** පොදු ප්‍රවාහන සේවයේ ආදායම් ඉල්ලුම් නම්‍යතා (Income Elasticity of Demand) සංගුණකය "- 0.48" ක් ලෙස ඇස්තමේන්තු කර ඇත, එබැවින් පොදු ප්‍රවාහන සේවය සාමාන්‍ය භාණ්ඩයක් (Normal good) ලෙස සැලකිය යුතුය. **(ලකුණු 08)**

## ප්‍රශ්න අංක 03

**අ) i.** "සංඛ්‍යා සූචක" (Cardinal) සහ "ක්‍රම සූචක" (Ordinal) උපයෝගිතා විශ්ලේෂණය යටතේ පාරිභෝගික හැසිරීම සම්බන්ධයෙන් කරනු ලබන ප්‍රධාන උපකල්පන අතර පවතින වෙනස කුමක්ද? පැහැදිලි කරන්න. **(ලකුණු 03)**

**ii.** "හීනවන ආන්තික උපයෝගිතා න්‍යාය " (The Law of Diminishing Marginal Utility) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

**iii.** "සංඛ්‍යා සූචක" (Cardinal) සහ "ක්‍රම සූචක" (Ordinal) උපයෝගිතා විශ්ලේෂණය යටතේ පාරිභෝගික සමතුලිතතාවය (Consumer equilibrium) පැහැදිලි කිරීම වෙනස් වන්නේ කෙසේද?. අවශ්‍ය තැන්හිදී රූප සටහන් භාවිතා කරන්න. **(ලකුණු 05)**

**ආ)** පහත වගුවේ දක්වා ඇති තොරතුරු සලකා බලන්න.

| ප්‍රමාණය (Quantity) | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **TUx** | 0 | 36 | 68 | 96 | 120 | 140 | 156 | 168 | 176 |
| **TUy** | 0 | 48 | 90 | 126 | 156 | 180 | 198 | 210 | 216 |

"X" භාණ්ඩයෙන් ලැබෙන මුළු උපයෝගිතාව (TUx) සහ "Y" භාණ්ඩයෙන් ලැබෙන මුළු උපයෝගිතාව (TUy) වේ.

X භාණ්ඩයක මිල රු. 4/= ක් සහ Y භාණ්ඩයක මිල රු. 3/= ක් නම් සහ එම පුද්ගලයා සතුව භාණ්ඩ වර්ග දෙක සඳහාම වියදම් කිරීමට රු. 45/= ක් පවතී නම්, පාරිභෝගික තෘප්තිය උපරිම වන ප්‍රමාණයන් (Quantities) සොයන්න. **(ලකුණු 07)**

**ප්‍රශ්න අංක 04**

අ) i. උදාහරණ ඇසුරින් පහත දැක්වෙන දෑ අතර වෙනස හඳුනාගන්න:
අ) ස්ථාවර සාධක යෙදවුම් (Fixed factor inputs) සහ විචල්‍ය සාධක යෙදවුම් (Variable factor inputs)
ආ) කෙටි කාලීන සහ දිගු කාලීන නිෂ්පාදනය (Short and long run production). **(ලකුණු 06)**

ii. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී ප්‍රශස්ත නිෂ්පාදන තීරණයකට එළඹීම සඳහා "හීන වන ආන්තික ඵලදා න්‍යාය " (විචල්‍ය සමානුපාතික න්‍යාය) (Law of Diminishing Marginal Returns (Law of Variable Proportions)) පිළිබඳ දැනුම නිෂ්පාදන කළමනාකරුවෙකුට උපකාරී වන්නේ කෙසේද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 08)**

ආ) දිගුකාලීන සාමාන්‍ය පිරිවැය (Long Run Average Cost) වක්‍රය "U" හැඩයක් ගැනීමට හේතු රූප සටහන් ඇසුරින් හඳුනාගන්න. **(ලකුණු 06)**

**ප්‍රශ්න අංක 05**

අ) i. පූර්ණ තරඟකාරී (Perfectly Competitive) සහ ඒකාධිකාරී තරඟකාරී (Monopolistically Competitive) වෙළඳපොළ සසඳා වෙනස්කම් දක්වන්න (Compare and contrast). **(ලකුණු 06)**

ii. පූර්ණ තරඟකාරී වෙළඳපොළක කෙටි කාලීන සැපයුම් වක්‍රය (Short run supply curve) රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

ආ) i. පූර්ණ තරඟකාරී ආයතනයකට කෙටි කාලීනව එහි ඒකක මිල ආන්තික පිරිවැයට සමාන වන ලක්ෂ්‍යයේදී (P = MC) එහි ලාභය උපරිම කර ගත හැකිද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

ii. ඒකාධිකාරී තරඟකාරී වෙළඳ පොළක පවතින ආයතන සඳහා මිල නොවන තරඟකාරී ක්‍රම (Non-price competitive methods) කෙතරම් වැදගත් වේද? උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

**ප්‍රශ්න අංක 06**

අ) i. ඒකාධිකාරයක (Monopoly) වාසි සහ අවාසි හඳුනාගන්න. **(ලකුණු 05)**

ii. "කර්මාන්තයේ පවතින එකම ආයතනය බැවින්, ඒකාධිකාරී ආයතනයක් කෙටි කාලීනව කිසිවිටෙකත් පාඩු නොලබයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

ආ) i. කතිපයාධිකාරී (Oligopolistic) වෙළඳපොළක පවතින ආයතන "ස්වාධීන" (Independent) ද නැතහොත් "අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතී" (Interdependent) ද? උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 06)**

ii. ශ්‍රී ලංකාවේ ස්වාභාවික වායු (Natural Gas) කර්මාන්තයේ වෙළෙඳපොළ ව්‍යුහය (Market Structure) ඔබ වර්ගීකරණය කරන්නේ කෙසේද? හේතු දක්වන්න. **(ලකුණු 04)**

*සියලුම හිමිකම් ඇවිරිණි*